**ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල ප්‍රජා ජීවනෝපාය මාර්ග ව්‍යාපෘතියේ (යළි පිබිදෙන ව්‍යාපෘතිය) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

---

උතුරු සහ නැගෙනහිර පළාත්වල හා තදාසන්න ප්‍රදේශවල ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල ප්‍රජා ජීවනෝපාය මාර්ග ව්‍යාපෘතියේ ( යළි පිබිදෙන ව්‍යාපෘතිය) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ( ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං ) අතර එළඹි 2004 ජුලි 23 දිනැති අංක 3935 සීර් දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) (i) වගන්තිය සහ 2007 සැප්තැම්බර් 25 දිනැති එහි සංශෝධිත ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා රජය සහ (ශ්‍රීලංර) ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) සමඟ 2010 ජනවාරි 11 දින එළඹි අංක 4671 එල්කේ දරණ දෙවැනි මූල්‍ය ගිණුමෙන් හා 2011 නොවැම්බර් 29 දින එළඹි අංක 4956 එල්කේ දරන තුන්වැනි ගිණුමෙන් මෙම ව්‍යාපෘතියට අතිරේක මූල්‍ය පහසුකම් සපයා තිබුණි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණ , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම්වලට අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ උතුරු සහ නැගෙනහිර පළාත්වල හා තදාසන්න ප්‍රදේශවල ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රජාවට තිරසාර, සමාජ හා ආර්ථික පරිපූර්ණත්වයක් ඇති කර ගැනීම සඳහා ජීවනෝපායයන් ප්‍රකෘති තත්ත්වයට පත් කර ගැනීමට කෘෂිකාර්මික හා වෙනත් නිෂ්පාදන සහ ආදායම් වැඩිකර ගැනීමට සහ ධාරිතාවය ගොඩනගා ගැනීමට උපකාරී වීමයි. මූල්‍ය ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 156.89 ක් වන අතර එයින් එජඩො මිලියන 124.70 ක් එනම් සියයට 88.35 ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) එකඟ වී තිබුණි. එජඩො මිලියන 13.72 හා එජඩො මිලියන 2.72 මූල්‍යනය කිරීම සඳහා පිළිවෙලින් ශ්‍රී ලංකා රජය හා ව්‍යාපෘතියේ ප්‍රතිලාභින් විසින් එකඟ වී තිබුණි. 2004 ජුලි 23 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන් එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව. සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3.** **මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ

(ඊ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 4.1 මූල්‍ය කාර්යසාධනය

---------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. 2,836,561,233 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.14,293,598,505 ක් විය. සමාලෝචිත වර්ෂයේ දරන ලද වියදම සහ ඉකුත් වර්ෂයේ වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| ක්‍රියාකාරකම් | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු | රු. |
| සිවිල් වැඩ | 2,143,597,249 | 2,966,078,625 | 7,440,823,920 |
| භාණ්ඩ සහ උපකරණ | 2,528,865 | 28,559,725 | 367,535,597 |
| උපදේශක සේවා | 108,934,967 | 162,015,760 | 873,291,364 |
| වර්ධක පිරිවැය | 146,122,106 | 190,425,231 | 1,069,265,005 |
| උපප්‍රදාන සඳහා වියදම් | 435,378,046 | 747,023,085 | 4,286,744,475 |
| ගංවතුර හානිය | - | - | 255,938,144 |
| එකතුව | 2,836,561,233 | 4,094,102,426 | 14,293,598,505 |

## 4.2 විශේෂ (ඩොලර්) ගිණුම

---------------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව විශේෂ (ඩොලර්) ගිණුමේ සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 8,391,543 | 1,067,075,280 |
| එකතු කළා : | | |
| ඌනපූර්ණයන් | 15,404,279 | 1,988,468,365 |
| විදේශ විනිමය වාසි | - | 26,942,559 |
| | 23,795,822 | 3,082,486,204 |
| අඩු කළා : | | |
| ආපසු ගැනීම් | 18,461,417 | 2,384,996,782 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,334,405 | 697,489,422 |

## **5. විගණන නිරීක්ෂණ**

**-------------------**

### **5.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

තෙවන මූල්‍ය ගිවිසුමට (අංක 4956) අදාළව ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන ගිය ලෙජර් ගිණුම්වලට අනුව සිවිල් වැඩ යටතේ දරන ලද මුළු වියදම රු.4,430,277,516 ක් විය. කෙසේ වෙතත්, එය රු.4,430,159,470 වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. සිවිල් වැඩ යටතේ දරන ලද මුළු වියදමෙහි රු.118,046 වෙනස පිළිබඳව විගණනයට පැහැදිලි කර නොතිබුණි.

## 6. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

## 6.1 අරමුදල් උපයෝජනය

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ සමුච්චිත වියදමට අදාළ ඇතැම් වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | | මූල්‍යනය සඳහා එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය වෙන් කිරීම | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජිත මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජිත මුදල | |
|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) |
| ජා.සං.සං.ගිවිසුම් අංක : | 3035 | 75.00 | 7,450 | 576 | 5.17 | 568.45 | 61.05 | 6,715.15 |
| | 4671 | 12.35 | 1,358 | 132 | 1.20 | 131.89 | 12.13 | 1,334.03 |
| | 4956 | 54.98 | 6,048 | 1,992 | 18.11 | 1,991.71 | 42.11 | 4,632.27 |
| ශ්‍රී ලංකා රජය | | 14.56 | 1,372 | 135 | 1.22 | 134.27 | 10.94 | 1,203.43 |
| එකතුව | | 156.89 | 16,228 | 2,835 | 25.69 | 2,826.32* | 126.23 | 13,884.88* |

* ප්‍රතිලාභී දායකත්වය සහ උපචිත වියදම් සඳහා ගිණුම්කරණ පිළියම් ඇතුළත් කිරීමේ හේතුවෙන් වාර්තාවේ 4.1 ඡේදයේපෙන්වා ඇති ප්‍රමාණයන් සමඟ මෙම ප්‍රමාණයන් එකඟ නොවීය.

(ආ) ලබාගත හැකි වූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දක්වා එක් එක් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල් සහ ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම පහත දැක්වේ.

| ක්‍රියාකාරම | ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාර වෙන් කරන ලද අරමුදල් | | 2013 දෙසැම්බර් 31 දක්වා දරන ලද වියදම | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු. |
| සිවිල් වැඩ | 59,608,488 | 7,786,361,295 | 59,403,003 | 7,440,823,920 |
| භාණ්ඩ හා උපකරණ | 2,593,927 | 338,831,820 | 2,450,272 | 367,535,597 |
| උපදේශන සේවා | 6,413,130 | 837,728,464 | 5,930,556 | 873,291,364 |
| වර්ධක පිරිවැය | 3,447,315 | 450,305,813 | 3,225,880 | 1,069,265,005 |
| ගිවිසුම යටතේ උප ප්‍රදාන | | | | |
| අංක : 3935 | 33,530,998 | 4,379,988,060 | 26,674,773 | 3,285,125,659 |
| අංක : 4671 | 6,844,687 | 894,087,541 | 6,859,365 | 799,503,831 |
| අංක : 4956 | 15,685,502 | 2,048,919,340 | 2,778,188 | 202,114,985 |
| එකතුව | 128,124,047 | 16,736,222,333 | 107,322,037 | 14,037,660,361* |

* ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් දරන ලද වියදම ඇතුළත් නොවේ.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගංවතුරෙන් බලපෑම් එල්ල වූ ජීවනෝපායන් සහිත ජනතාවට අත්‍යවශ්‍ය සහය සැපයීම ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යය වේ. අංක 4956 දරන තෙවන මූල්‍ය ගිවිසුම යටතේ ජීවනෝපායන්ට සහය දීමේ ක්‍රියාකාරකම් සඳහා උපප්‍රදාන වශයෙන් වෙන් කළ රු. මිලියන 2,049 ක් වූ අරමුදල්වලින් රු. මිලියන 363 ක් හෝ සියයට 18 ක් පමණක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර තිබුණි.

(ආ) ප්‍රජා අත්පොතේ III වන පරිච්ඡේදය අනුව යටිතල පහසුකම් සඳහා උපප්‍රදාන වශයෙන් පළමු මූල්‍ය ගිවිසුම යටතේ රු. 1,455,403,200 ක මුදලක් වෙන් කර තිබුණද, 2013 දෙසැම්බර් 31 දක්වා එම ක්‍රියාකාරකම් සඳහා රු. 2,050,065,282 ක මුදලක් වැය කර තිබුණි. ඒ අනුව අදාළ අරමුණු සඳහා දරන ලද තථ්‍ය පිරිවැය රු. 594,662,082 කින් එකී වෙන්කිරීම ඉක්මවා තිබුණි.

(ඇ) උතුර කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමේ ව්‍යාපෘතිය යනුවෙන් හැඳින්වෙන වෙනත් ව්‍යාපෘතියක් යටතේ නිම කිරීමට නියමිත ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් රු. 31,819,663 ක මුදලක් වැය කර තිබෙන බව නිරීක්ෂණය විය.

## 6.2 භෞතික කාර්යසාධනය

### 6.2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

**(අ) ග්‍රාමීය පුනරුත්ථාපනය සහ සංවර්ධන ක්‍රියාකාරකම්**

2013 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ ඉටු කළ යුතු ක්‍රියාකාරකම්වලට සහ 2013 දෙසැම්බර් 31 දිනට නිම කළ ක්‍රියාකාරකම්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | ඉටුකළ යුතු ක්‍රියාකාරකම් | | 2013 දෙසැම්බර් 31 දිනට නිමකළ ක්‍රියාකාරකම් | | 2013 දෙසැම්බර් 31 දිනට නිමකළ යුතු ක්‍රියාකාරකම් | |
|---|---|---|---|---|---|---|
| | පළමු මූල්‍ය ගිවිසුම යටතේ | දෙවෙනි මූල්‍ය ගිවිසුම යටතේ | පළමු මූල්‍ය ගිවිසුම යටතේ | දෙවෙනි මූල්‍ය ගිවිසුම යටතේ | පළමු මූල්‍ය ගිවිසුම යටතේ | දෙවෙනි මූල්‍ය ගිවිසුම යටතේ |
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් | 2,414 | 1,027 | 2,120 | 949 | 294 | 78 |
| ජීවනෝපායන්ට සහය දීම පිළිබඳ අතුරු ණය | 159,888 | 57,333 | 94,627 | 19,988 | 65,261 | 37,345 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමට අපේක්ෂා කර තිබියදී, යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් යටතේ ඉටු කළ යුතු ඉදිකිරීම් කටයුතුවල මන්දගාමී ප්‍රගතියක් දක්නට ලැබුණි.

(ii) පළමු මූල්‍ය ගිවිසුම යටතේ චක්‍රීය අරමුදලින් ප්‍රතිලාභීන්ට ණය 159,888 ක් ප්‍රදානය කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් මුළු වෙන්කිරීමෙන් ණය 94,627 ක් පමණක් එනම් සියයට 59 ක් 2013 දෙසැම්බර් 31 දක්වා ප්‍රදානය කර තිබුණි. තව ද ව්‍යාපෘතිය විසින් දෙවන මූල්‍ය ගිවිසුම යටතේ චක්‍රීය අරමුදලින් ණය 57,333 ක් ලබා දීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් මුළු වෙන්කිරීමෙන් ණය 19,988 ක් පමණක් එනම් සියයට 35 ක් 2013 දෙසැම්බර් 31 දක්වා ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් කරන ලද පැහැදිලි කිරීමට අනුව අස්ථිර පදනම මත අරමුණු ඉලක්කගත කර තිබුණු අතර ව්‍යාපාර යෝජනාවන්හි ස්වශක්තතාව තුළින් ණය ලබාදීම සඳහා තථ්‍ය ප්‍රතිලාභීන් තෝරාගෙන තිබුණි.

**(ආ) පොකුරු මට්ටමේ ජීවන තත්ත්ව සංවර්ධන ක්‍රියාකාරකම්**

**-----------------------------------------------------------------**

2013 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව සහ 2013 දෙසැම්බර් 31 දිනට අවසන් කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉටුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් | 2013 දෙසැම්බර් 31 දිනට නිමකළ ක්‍රියාකාරකම් |
|---|---|---|
| ග්‍රාමීය සංවර්ධනයේ සංවිධාන | | 17 |
| පොකුරු කුඩා පොකුරු | 114 | 29 |
| පවුල් ආර්ථිකය ඉහළ නැංවීමේ පොකුරු පැකේජය | | 17 |
| | 114 | 63 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නැගෙනහිර පළාතේ බොහෝ ගැටුම්වල බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවලින් එකක් වූ අම්පාර දිස්ත්‍රික්කයේ 2013 දෙසැම්බර් 31 දක්වා නිම කරන ලද මුළු පොකුරු ක්‍රියාකාරකම්වලින් කිසිදු ක්‍රියාකාරකමක් නිම කර නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට අනුව අම්පාර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙන් ස්වශක්තතා යෝජනාවක් නොලැබුණි. එම නිසා ඉලක්කය කරා ළඟා වීමට නොහැකි විය.

(ii) ප්‍රගති වාර්තාවලට අනුව, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරකම් දෙකක් නිම කර තිබුණි. කෙසේ වෙතත්, එම ක්‍රියාකාරකම් දෙක ද විදුලිබලය සැපයීමේ ප්‍රමාදය හේතුවෙන් මුල් අදියරේ පැවතුණු බව 2014 ජුනි 11 දින පවත්වන ලද භෞතික පරීක්ෂණයෙන් හෙළිදරව් විය.

**(ඇ) ගංවතුරින් වූ හානි සඳහා ක්‍රියාත්මක කරන ලද සිවිල් සහ ප්‍රතිසංස්කරණ කටයුතු**

2013 ක්‍රියාකාරී සැලැස්මෙන් නියම කරන ලද ක්‍රියාකාරකම්වල ඉලක්ක සහ 2013 දෙසැම්බර් 31 දිනට නිම කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සංරචක | ක්‍රියාකාරී සැලැස්මට අනුව නිම කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් | 2013 දෙසැම්බර් 31 දිනට නිම කළ ක්‍රියාකාරකම් |
|---|---|---|
| **සිවිල් වැඩ** | | |
| කුඩා වැව් | 144 | 101 |
| **ගංවතුර හානි පුනරුත්ථාපනය** | | |
| ජීවන තත්ත්වයන් පුනස්ථාපනය ක්‍රියාකාරකම් (පොලිනෙට් ආවරණ) | 3,026 | 988 |
| කුඩා පරිමාණයේ පුනරුත්ථාපනය | | |

| | | |
|---|---|---|
| වාරිමාර්ග යෝජනා ක්‍රම | 273 | 183 |
| ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය | 620 | 546 |
| පානීය ජලයෝජනා ක්‍රමය පුනරුත්ථාපනය | 96 | 53 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දින දක්වා ග්‍රාමීය වැව් 144 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කළද, එම දිනට ප්‍රතිසංස්කරණය කර තිබුණේ වැව් 101 ක් පමණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට අනුව අනෙකුත් සිවිල් වැඩ 43 සිදු කෙරෙමින් පැවතුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දින දක්වා ජීවනෝපායන් පුනස්ථාපනය කිරීමේ ක්‍රියාකාරකම් 3,206 ක් නිම කිරීමට ඉලක්ක කර තිබුණ ද, ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ අසාර්ථකත්වය හේතුවෙන් එම දින වන විට නිම කර තිබුණේ ක්‍රියාකාරකම් 988 ක් පමණි.

### 6.2.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

#### (අ) කාලගුණයට ඔරොත්තු දෙන කෘෂිකාර්මික පොලිනෙට් ආවරණ ප්‍රසම්පාදනය (CSA)

--------------------------------------------------------------------------------------------

ව්‍යාපෘතිය විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා පොලි නෙට් ආවරණ 3000 ක් ඉදිකිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර එයින් 2013 දෙසැම්බර් 31 දිනට ඉදිකර තිබුණේ දිස්ත්‍රික්ක 10 ක පොලිනෙට් ආවරණ 428 ක් පමණක් බව නිරීක්ෂණය විය.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ උතුරු නැගෙනහිර පළාත්වල ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට සහ ගම්වලට ඔවුන්ගේ ජීවනෝපායන් යථා තත්ත්වයට පත් කරගැනීමට සහ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නංවා ගැනීමට සහය දීම වුවත්, යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්කවල කිසිදු පොලි නෙට් ආවරණයක් ඉදි කර නොතිබුණි.

(ii) ඉහත සඳහන් පොලි නෙට් ආවරණ ප්‍රසම්පාදනය සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරාගැනීමට ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරන ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා එක් එක් දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දී තිබුණි. කෙසේ වුවද, සැපයුම්කරුගේ නිෂ්පාදන ධාරිතාව සහ ක්ෂේත්‍රයේ පෙර පළපුරුද්ද නොසලකා හරිමින් ඉහත සඳහන් පොලි නෙට් ආවරණ 428 දිස්ත්‍රික්ක 10 කට සපයා සවි කිරීම සඳහා තෝරාගෙන තිබුණේ එක් පුද්ගලික සමාගමක් පමණි.

(iii) ගෙවීම් කළ යුත්තේ අවශ්‍ය ප්‍රමාණයෙන් පොලි නෙට් ආවරණ ප්‍රසම්පාදනයෙන් සහ එකඟ වූ සේවාවන් සැපයීමෙන් පසුව පමණක් වුවද, ඇතැම් අවස්ථා රු.85,000 ක් වූ එක් පොලි නෙට් ආවරණයක් සඳහා ගෙවීම් එවැනි අවශ්‍යතාවක් සපුරාලීමෙන් තොරව නිදහස් කර තිබූ බව විගණනයේදී අනාවරණය විය. එවැනි අවස්ථාවන් පහතින් විස්තර කෙරේ.

- අවශ්‍ය පිරිවිතරයන්ට අනුකූල නොවූ පොලි නෙට් ආවරණ 300 ක් සඳහා රු. 3,276,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තුවට අනුව, කෘෂිකාර්මික කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ද්‍රව්‍ය සහ උපකරණ සැපයීම වෙනුවෙන් ගොවි මහතෙකුට රු.9,000 ක මුදලක් වෙන්කොට ඇත. කෙසේ වුවද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ගොවි මහතුන් 24 දෙනෙකුට රු. 216,000 ක් වටිනා එවැනි ද්‍රව්‍ය සපයා නොමැති බව භෞතික සත්‍යාපනයේදී හෙළි විය.
- තවද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් 14 දෙනෙකුට එක් පොලි නෙට් ආවරණයක් සඳහා රු.3,000 ක් වටිනා දිය ඉසීමේ උපකරණ පද්ධතියක් සපයා නොමැත. එවැනි දිය ඉසීමේ උපකරණ පද්ධතියක වටිනාකම රු. 49,000 ක් වේ.

**(ආ) ආරුක්කු හැඩැති පොලි නෙට් ආවරණ ප්‍රසම්පාදනය**

---------------------------------------------------------------

ඉහත සඳහන් කරුණුවලට අමතරව, ව්‍යාපෘතිය විසින් 2011 දී පොලි නෙට් ආවරණ 1,200 ක් ප්‍රසම්පාදනය සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ඇත. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්කරුවා සමඟ අත්සන් කරන ලද ගිවිසුමට අනුව, මධ්‍යම පළාතේ ගොවීන් සඳහා වටිනාකම රු. 155,595 ක් වූ ආරුක්කු හැඩැති පොලි නෙට් ආවරණ 1,200 ක් සැපයීමට එකඟ විණි. කෙසේ වුවද, මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල ගොවීන් සඳහා සපයන ලද පිළිවෙලින් රු. 158,486 ක් හා රු.159,694 ක් එවැනි පොලි නෙට් ආවරණ 73 ක් සඳහා වෙනස් මිල ගණන් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු. 242,451 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ii) පොලි නෙට් ආවරණ ප්‍රසම්පාදනය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් හෝ ප්‍රසම්පාදන පටිපාටීන් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, එක් දිස්ත්‍රික්කයකට ප්‍රසම්පාදනය කළ ආරුක්කු හැඩැති පොලි නෙට් ආවරණ වෙනත් දිස්ත්‍රික්කවලට පාරිසරිකව නොගැලපෙන හෙයින් අමතර වැඩ සඳහා රු. 16,327,284 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(iii) තවද, අලුත්වැඩියා සඳහා ගෙවීම් සිදුකරන විට, දෝෂ සඳහා වන වගකීම් කාලය අවසන් වී නොතිබුණද, සමාලෝචිත වර්ෂයේදී ආරුක්කු හැඩැති පොලි නෙට් ආවරණ අලුත්වැඩියාව සඳහා රු. 1,761,020 ක මුදලක් තෙවන පාර්ශවයකට ගෙවා ඇත.

**(ඇ) ඉදිකිරීම් සඳහා පස් සැපයීමේ කොන්ත්‍රාත්තුව**

---------------------------------------------------

වැව් නවයක බැම් ඉදිකිරීම සඳහා පිළියෙල කරන ලද ප්‍රමාණ පත්‍රයට අනුව, භාවිතය සඳහා පිට ප්‍රදේශවල පස් හැරීම, ප්‍රවාහනය හා වෙනත් පිරිවැයට අදාළ මිල ගණන් වෙනම ඇතුළත් කර ඇත. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු වැව්වලින් හාරන ලද පස්ම එම වැව් බැම් ඉදිකිරීම සඳහා යොදාගෙන ඇත. තවද, පිට ප්‍රදේශවල පස් හැරීමේ සහ ප්‍රවාහනය කිරීමේ පිරිවැය නොසලකා රු. 44,881,497 ක් වූ ප්‍රමාණ පත්‍රයේ මුළු මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා ඇත.

**(ඈ) තත්ත්ව පාලනය සඳහා වෙන් කරන ලද අරමුදල් උපයෝජනය**

**--------------------------------------------------------------------------**

වැව් 12 ක ඉදිකිරීම් කටයුතුවල තත්ත්ව පරීක්ෂණය සඳහා ඇස්තමේන්තුවෙන් රු.2,109,000 ක මුදලක් වෙන් කර තිබුණද, වැය කර තිබුණේ වැව් 06 ක් සඳහා රු.114,318 ක මුදලක් පමණි. රු.1,994,682 ක් වූ ඉතිරි අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

**(ඉ) පළාත් මාර්ග පුනරුත්ථාපනය සහ වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය**

**----------------------------------------------------------------------------------**

ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද පළාත් මාර්ග පුනරුත්ථාපනය සහ වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය පිළිබඳ ක්‍රියාකාරකම්වලට අදාළ භෞතික පරීක්ෂණ අවස්ථා කිහිපයකදීම සිදු කර ඇති අතර විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහතින් විස්තර වේ.

(i) පබුරන සුභවිල මාර්ගය රු.22,258,620 ක පිරිවැයක් දරා ඉදි කොට තිබුණද, 2014 මාර්තු 17 දින සිදු කළ භෞතික පරීක්ෂණයේදී ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් මාර්ගය මතුපිට වළවල් කිහිපයක් තිබීම හේතුවෙන් එය භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය විය.

(ii) උණකටු ඔය අමුණ ඉදිකිරීම සඳහා පිළියෙල කරන ලද ඇස්තමේන්තුවට අනුව, ගියර පෙට්ටිය සමඟ ජල පාලන දොරටුව සැපයීම සහ සවිකිරීම සඳහා රු.604,539 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු එක ගියර පෙට්ටියකට රු.244,200 ක් බැගින් වූ අමතර මුදලක් ලබාගෙන ඇති අතර මේ සඳහා ව්‍යාපෘතිය විසින් රු.1,465,200 ක මුළු පිරිවැයක් දරා ඇත.

(iii) ඉංජිනේරුවරයා විසින් පිළියෙල කරන ලද සටහන්වල ඇතුළත් දොරටුවල ප්‍රමාණය අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු හෙයින් අමුණේ ජල පාලන දොරටු 11ට රබර් ජල සීල් 11 ක් සවි කිරීම සඳහා රු. 623,876 ක වටිනාකමින් යුත් අමතර වැඩ ප්‍රමාණයක් පෙරප්පන්කඩු අමුණ යටතේ සිදුකර ඇත.

(iv) රජ ඇළ පිහිටි මින්නේරිය ඔය හරහා පාලමක් ඉදිකිරීම සඳහා සටහන් පිළියෙල (drawings) කිරීමට පෞද්ගලික උපදේශක ආයතනයකට රු. 416,665 ක මුදලක් ගෙවා තිබුණි. සටහන්වලට අනුව, පාලමේ පළල මීටර 5.9 ක් විය යුතුය. කෙසේ වුවද, උපදේශක ආයතනය විසින් පිළියෙල කරන ලද සටහන් වෙනස් කර ඉදිකරන ලද පාලමේ පළල මීටර 4.15 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සටහන් පිළියෙල කිරීමට වැය කළ රු. 416,665 ක මුදල නිශ්ඵල වියදමක් වී තිබුණි.

(v) කිඹුලාගල වැව පුනරුත්ථාපනය සඳහා පිටාර ගලා යාමේ ප්‍රදේශයට ආසන්නව පිහිටි හෙක්ටයාර 1.2 ක භූමි භාගයක ඝනව නොවැඩුණු කැලෑව එළිකිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.150,000 ක මුදලක් වැය කර ඇත. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු එළි කර තිබුණේ හෙක්ටයාර 0.50 ක කැලෑ ප්‍රදේශයක් පමණක් වන අතර මේ නිසා රු. 87,500 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

**6.2.4 මතභේදයට තුඩු දෙන කරුණු**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2005 අංක 05 දරන මූල්‍ය පනතේ III කොටසට අනුව, කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 15 කට වැඩි වුවහොත් කොන්ත්‍රාත් අගය මත ඉදිකිරීම් කර්මාන්ත ආරක්ෂණ අරමුදල් බද්ද අඩු කර එය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වුවද, වටිනාකම රු. මිලියන 15 ඉක්මවූ කොන්ත්‍රාත් 80 කින් රු.5,355,921 ක් වූ ඉදිකිරීම් කර්මාන්ත ආරක්ෂණ අරමුදල් බද්ද අඩු කර නැත.

(ආ) පරාක්‍රමපුර මංසන්ධියේ සිට කොබ්බෑකඩුව මංසන්ධිය දක්වා සහ කොබ්බෑකඩුව මංසන්ධියේ සිට සම්පතුනාම් දක්වා වූ මාර්ග දෙකෙහි වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව පිළිවෙලින් රු.31,552,232 සහ රු.46,512,985 කට ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, උතුර යථා තත්ත්වයට පත් කිරීමේ කඩිනම් ව්‍යාපෘතිය විසින් සපයන ලද අරමුදල් යටතේ වැඩිදියුණු කිරීමේ කටයුතු නැවත සැලසුම් කොට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර ඇති හෙයින් ඉහත සඳහන් වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා වූ

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ දින සිට වසරකින් පසුව අවසන් කර ඇති අතර ඒ සඳහා රු. 23,808,727 ක් ගෙවීම් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති අරමුදල් මඟින් දරන ලද රු. 23,808,727 ක මුදල නිශ්ඵල වියදමක් බවට පත් වී ඇත.

(ඇ) කොන්ත්‍රාත් වටිනාකම රු. 15,908,588 ක් වූ අම්පාර දිස්ත්‍රික්කයේ සගමම්හි නීත්තයිආරු හරහා පිහිටි උඩුකුඩල අමුණ පුනරුත්ථාපනය සඳහා 2012 අගෝස්තු 21 දින කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ඇත. කෙසේ වුවද, කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හේතුවෙන් වැඩ බිමට පිවිසීමට නොහැකි වූ හෙයින් කොන්ත්‍රාත්කරුට රු. 2,915,367 ක මුදලක් ගෙවීමෙන් පසු 2014 පෙබරවාරි 11 දින මෙම පුනරුත්ථාපන කටයුතු අවසන් කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති අරමුදලින් දරන ලද රු. 2,915,367 ක මුදල නිශ්ඵල වියදමක් බවට පත් වී ඇත.

(ඈ) මාර්ගය මතුපිට කි.මී. 3.9 ක් දිගට බොරළු පුරවා ඇතිරීමටත් කි.මී. 1.55 ක් දිගට කොන්ක්‍රීට් ඇතිරීමටත් රු. 16,516,120 ක මුදලකට 2011 සැප්තැම්බර් 05 දින කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ඇත. 2012 අගෝස්තු 25 දින කොන්ත්‍රාත්කරු වැඩ අතහැර දමා ඇති අතර කොන්ත්‍රාත්කරු වැඩ වලින් සියයට 40 ක් සම්පූර්ණ කර ඇති හෙයින් ව්‍යාපෘතිය විසින් ඔහුට රු. 6,853,381 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ඉතිරි වැඩ සම්පූර්ණ කර ගැනීම සඳහා රු. 27,403,423 කට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹීමට ව්‍යාපෘතියට සිදු විය. එම නිසා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලංසු නිසියාකාරව ඇගයීමක් ව්‍යාපෘතිය මඟින් සිදු නොකළ හෙයින් වැඩ සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා ව්‍යාපෘතියට රු.17,740,684 ක් අමතර වියදමක් දැරීමට සිදු විය.

(ඉ) ව්‍යාපෘතිය විසින් කි.මී. 2500 ක උපරිම මාසික භාවිතයකට යටත්ව මාසිකව රු. 125,000 ක ගාස්තුවකට මාස 7 ½ ක කාලයකට අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා ඉංජිනේරුවරයා වෙත වාහනයක් සැපයීම සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ඇත. කෙසේ වෙතත්, එම කොන්ත්‍රාත්කරුම එම කාලය සඳහා රු.50,000 ක මාසික ගාස්තුවකට එම කොන්දේසි වලටම යටත්ව වෙනත් ඉදිකිරීම් කටයුත්තක් සඳහා වාහනය සැපයීමට එකඟ වී ඇත. එම නිසා වාහනය රු. 50,000 ක මාසික ගාස්තුවකට කුලියට ගත හැකි වූයේ නම් ව්‍යාපෘතියට රු.562,500 ක මුදලක් ඉතිරි කර ගැනීමට හැකියාව තිබුණි.

**6.5 ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීම.**

---------------------------------------------------------

ගම්වැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත. ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමයේ දිස්ත්‍රික්ක වශයෙන් කාර්යසාධනයට සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | කේන්ද්‍රීය ගම් සංඛ්‍යාව | ව්‍යාපෘති අරමුදල් වලින් සපයන ලද ණය | චක්‍රීය අරමුදල් වලින් සපයන ලද ණය | හිඟ හිටි ණය ශේෂ | බොල් ණය ප්‍රමාණය | බොල් ණය සපයන ලද ණය මුදලේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | රු.මි. | රු. මි. | රු. මි. | | |
| අම්පාර | 56 | 74.0 | 75.9 | 61.0 | 5.8 | 8 |
| මඩකලපුව | 60 | 75.0 | 141.8 | 60.4 | 8.7 | 12 |
| ත්‍රිකුණාමලය | 51 | 82.0 | 119.9 | 79.6 | 11.9 | 15 |
| වවුනියාව | 97 | 114.0 | 119 | 93.5 | 25.6 | 22 |
| මන්නාරම | 88 | 115.0 | 195.9 | 64.0 | 9.4 | 8 |
| යාපනය | 73 | 103.0 | 157.2 | 80.1 | 9.5 | 9 |
| කිලිනොච්චිය | 62 | 83.0 | 68.3 | 47.2 | 11.1 | 13 |
| මුලතිව් | 89 | 71.0 | 91.8 | 62.9 | 17.0 | 24 |
| අනුරාධපුරය | 70 | 83.0 | 173.5 | 83.3 | 13.5 | 16 |
| පොළොන්නරුව | 50 | 72.0 | 110.8 | 67.1 | 7.6 | 11 |
| පුත්තලම | 51 | 71.0 | 130.5 | 65.6 | 6.6 | 9 |
| මොණරාගල | 55 | 90.0 | 99.3 | 79.7 | 2.7 | 3 |
| එකතුව | 802 | 1,033.0 | 1,483.90 | 844.40 | 129.40 | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළමු මූල්‍ය ගිවිසුම යටතේ වර්ෂ 2005 සිට 2008 දක්වා කාලය තුළදී ව්‍යාපෘතිය විසින් කේන්ද්‍රීය ගම් 237ක ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබූ අතර රු. මිලියන 183 ක් වූ උපණය, ප්‍රතිලාභීන්න් 8,935 ක් වෙත ලබා දී තිබුණි. කෙසේ වුවද, ඉහත සඳහන් ප්‍රතිලාභීන්ට දෙන ලද ණය අධීක්ෂණය කිරීමට ව්‍යාපෘතිය විසින් 2008 වර්ෂයෙන් පසු කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව, ව්‍යාපෘති අරමුදල් අයථා ලෙස අත් කර ගැනීමට ව්‍යාපෘතිය විසින් ප්‍රතිලාභීන්ට අවස්ථා සලසා දී ඇති බව පැහැදිලි විය.

(ආ) ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමය යටතේ එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද අරමුදලින්, සැලකිය යුතු ව්‍යාපෘති අරමුදල් ප්‍රමාණයක් බැංකු ශේෂ, හිඟ හිටි ණය ශේෂ සහ බොල්ණය ලෙස ඉතිරි වී තිබුණි. එම නිසා, ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමය යටතේ වෙන් කරන ලද අරමුදල් එම අරමුදල් සපයන ලද කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි. ඇතැම් දිස්ත්‍රික්කවල නිරීක්ෂණය වූ එවැනි අවස්ථා පහත දැක්වේ.

| **දිස්ත්‍රික්කය** | **ව්‍යාපෘති අරමුදලින් සැපයූ ණය** | **මුදල් ශේෂය** | **බැංකු ශේෂය** | **බොල් ණය ප්‍රමාණය** | **අරමුදලේ වත්කම්වල වර්තමාන වටිනාකම** |
|---|---|---|---|---|---|
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| වවුනියාව | 114.0 | 2.0 | 25.0 | 25.6 | 126.5 |
| මන්නාරම | 115.0 | 0.6 | 42.1 | 9.4 | 106.1 |
| යාපනය | 103.0 | 1.5 | 28.0 | 9.5 | 109.6 |
| කිලිනොච්චිය | 83.0 | 1.1 | 36.8 | 11.1 | 85.2 |
| මුලතිව් | 71.0 | 1.3 | 20.7 | 17.0 | 84.9 |

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති අරමුදල්වලින් සහ අයවිය යුතු අරමුදල්වලින්, හිඟ හිටි ණය අම්පාර, වව්නියාව සහ මොනරාගල දිස්ත්‍රික්කවලට ප්‍රදානය කළ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 40 කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කළ අතර වෙනත් දිස්ත්‍රික්ක නවයක හිඟ හිටි ණය එම දිස්ත්‍රික්ක වලට ප්‍රදානය කළ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 20 කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කෙරුණි.

(ඈ) දෙසැම්බර් 31 දිනට වවුනියාව දිස්ත්‍රික්කයට ප්‍රදානය කළ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 20 කට වැඩි ප්‍රමාණයක් බොල්ණය මඟින් නියෝජනය වී ඇත.